C
3028.9
(Thesis)
1983-3-14

# මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය නව යෞවන පාසැල් සිසුන්ගේ කියවීමේ රුචිකත්වය කෙරේ බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

දයා චන්ද්‍රසෝම අබේකෝන්.

පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා
අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත්
කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

1981 දෙසැම්බර්

නිබන්ධ උපදේශක

ආචාර්ය මොහොට්ටිගේ ඌ. සේදර

360033

PERMANENT REFERENCE
FOR USE BY THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පුස්තකාලය
1983-3-14
පේරාදෙණිය

## සාරාංශය

ග්‍රාමීය නව යෞවන පාසැල් සිසුන්ගේ කියවීම් රුචිකත්වය පිළිබඳ අනාවරණයන් කිරීම අරමුණු කර ගත් මෙම පර්යේෂණයේ නියැදිය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය යැයි සම්මත පාසැල් 05කින්, අවුරුදු 14,15,16 සහ 17 යන වයස් තලවලට අයත් ළමුන් 400ක් තෝරා ගැණින. ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් 200 බැගින් එහි අඩංගු විණ. ශ්‍රේණි වශයෙන් ගත් කල 8 වෙනි ශ්‍රේණියේ සිට 12 වෙනි ශ්‍රේණිය දක්වා වූ ශ්‍රේණිවලට මොවුන් අයත් විණ.

අපේක්ෂිත පර්යේෂණ කාර්යයන් වටා දත්ත රැස්කරනු වස් ප්‍රශ්නාවලී ක්‍රමය සමූහ පරීක්ෂණයක් ලෙසින් භාවිතයට ගැණින.

ග්‍රාමීය නව යෞවන පාසැල් ළමුන්ගේ වයස, ස්ත්‍රී/පුරුෂ බව, මව්පිය සමාජ ආර්ථික මට්ටම, පෞරුෂයේ බහිර්වර්තික - අන්තර්වර්තිත බව, දේශපාලනික අභිනතිය යන ස්වායත්ත විචල්‍යයන් හා කියවීම් රුචිකත්වයේ විවිධ අංශයන් දක්වන ලක්ෂණ හඳුනා ගැනීමත්, නම්‍යතා හඳුනා ගැනීමත් සඳහා දත්ත විශ්ලේෂණය යොමුවිණ.

දත්ත විශ්ලේෂණයේදී ඒ ඒ සාධක අනුව රුචිකත්වයේ විවිධ අංශ හා බැඳි සංඛ්‍යාත, අනුපාත හා ප්‍රතිශතක ගණනය කෙරුණු අතර, එම ප්‍රතිශතකයන් දක්වන සංඛ්‍යානාත්මක වෙසෙසියාවන් Z පරීක්ෂණය යොදා ගෙන විමසීමට භාජනය කරන ලදී.

විශ්ලේෂණය මගින් ලැබූ පර්යේෂණ ප්‍රතිඵල:-

1. ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් හා පිරිමි ළමුන්ට පුවත්පත් ලබා ගැනීමේ පහසුකම් ද පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාවන් ද සතුටු දායක මට්ටමක නො පවත්නා බව අධ්‍යයනයෙන් අනාවරණය වන අතරම,

එම පහසුකම් මඳකම ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් හා පිරිමි ළමුන්ගේ කියවීම් රුචිකත්වය කෙරේ බලපෑම් කළ වගට ඉඟින් ද මෙම අධ්‍යයනයෙන් අනාවරණය වේ.

2. කියවීම් රුචිකත්වය ප්‍රකාශ කෙරෙන පුවත්පත්, ප්‍රවෘත්ති විශේෂ හා රුචිකත්වය දනවන නවකථා හා කෙටිකථා කෙරේ, ස්ත්‍රී/පුරුෂ භාවය බල පෑම් කරන ප්‍රධාන සාධකයක් බැව් අනාවරණය විණ. එහෙත් අධ්‍යාපනික පත පොත පිළිබඳවත්, කියවීමට හසුවන පුවත්පත් අතරත්, ස්ත්‍රී/පුරුෂ වශයෙන් එවැනි කැපී පෙනෙන වෙනස්කම් දක්නට නොමැත.

3. අන්තර්වර්තික හා බහිර්වර්තික බව, ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් හා පිරිමි ළමුන්ගේ නවකථා හා කෙටිකථා කියවීමේ රුචිකත්වය කෙරෙහි වෙසෙසි බලපෑම් දක්වා ඇත.

4. පුස්තකාල සාමාජිකත්වය, පුවත්පත් මිලදී ගැනීමේ ප්‍රතිශතකය හා විවිධ වර්ගවල පුවත්පත් කියවීමේ රුචිකත්වය කෙරේ බලපා ඇති ප්‍රධාන සාධකය සමාජ පංතියය, ඇතැම් වර්ගවල නවකථා හා කෙටිකථා (විද්‍යා, ඓතිහාසික, ආදර, ක්‍රීඩා) කියවීමේ රුචිකත්වය කෙරෙහි ද සමාජ පංතිය වෙසෙසි ලෙස බලපෑම් දක්වා ඇත.

5. දේශපාලනික අභිනතිය කියවීම් රුචිකත්වය කෙරේ බලපාන සාධකයක් ලෙස වැඩි බලපෑමක් කර ඇත්තේ, ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් කෙරේ පමණි.

6. ආගමික අභිනතිය, ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් හා පිරිමි ළමුන්ගේ නවකථා හා කෙටිකථා කියවීමේ රුචිකත්වය කෙරේ බලපෑම් කරන සාධකයක් බැව් අනාවරණය වේ.

7. වයස් තල අනුව වයස අවුරුදු 14-17 දක්වා වැඩෙත්ම ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් හා පිරිමි ළමුන්ගේ කියවීම් රුචිකත්වය ද ක්‍රමයෙන් වර්ධනය

වන බැව් හෙළි වන අතරම, වයසින් වැඩෙත්ම පුවත්පත්, නවකථා/ කෙටිකථා හා සඟරා වැනි දෑය කියවීමේ රුචිකත්වය කෙරේ ගැහැණු හා පිරිමි ළමුන් අතර පැවැති වෙනස්කම් ද ක්‍රමයෙන් හීනවී ගෙන යන බැව් අධ්‍යයනයෙන් අනාවරණය වේ.

4. පොදු වශයෙන් සලකන කල අධ්‍යයනයට ලක්වූ ග්‍රාමීය ගැටවර ජනගහනයේ කියවීම් රුචිකත්වය හා බැඳි ප්‍රතියතන, ද්විතීය පාසැල් ජනගහනයක් වශයෙන් සතුටු විය හැකි මට්ටමක නො පවතී. කියවීම් ද්‍රව්‍ය ඉතා පටු සීමාවන් තුළ විහිදී ඇත. රජයෙන් ප්‍රකාශිත සඟරා වැනි ද්‍රව්‍ය, සිංහල පුවත්පත්, පාසැල් විෂයයන් හා බැඳුනු සහිපතා පුවත්පත්, පාසැල්හි භාවිතා වන නවකථා හා කෙටිකථා වැනි කියවීම් ද්‍රව්‍ය වලින් බැහැර පැතුරුණු රුචිකත්වයක් ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් අතර පවත්නා බවක් සමීක්ෂණයෙන් හෙළි නොවේ.